# THE WESTMINISTER MODEL IN SRI LANKA AND ITS CHANGES (Part VI)

# මූලික අයිතිවාසිකම්

මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා මානව හිමිකම් නීති සංග්‍රහයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයන්හි ලක්ෂණයක් වන බැවින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ඉතිහාසයේ ප්‍රථම වරට මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්තිය ලෝකයේ සෙසු රටවල මූලික අයිතිවාසිකම් වගන්ති අනුගමනය කරමින් පිහිටුවා තිබේ.

- සර්ව සාධාරණීයත්වය.
- අත්තනෝමතික ලෙස ජීවිත අහිමි කිරීමෙන් නිදහස් වීම.
- නිදහස සහ පෞද්ගලික සුරක්ෂිත භාවය.
- සිතීමේ නිදහස.
- හෘදය සාක්ෂ්‍යයේ නිදහස සහ ආගමික නිදහස.
- ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ සහ වැඩිදියුණු කිරීමේ නිදහස.
- භාෂණයේ සහ අදහස් පළ කිරීමේ නිදහස.

ClassWork.LK

යනාදි අයිතිවාසිකම් ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබිණි. 1972 අයිතිවාසිකම් පිළිගැනීමක් ලබා දුන්නද එම අයිතිවාසිකම් පරිච්ඡේදයේ දුර්වලතා කිහිපයක් පැවතිණි.

- මෙම ව්‍යවස්ථාවෙන් සඳහන් අයිතිවාසිකම් අවසර දිය හැකි සීමාවන්ට යටත් කර තිබීම.

- ව්‍යවස්ථාවෙන් අයිතිවාසිකම්වලට නිල පිළිගැනීම ලබා දුන්න ද අයිතිවාසිකම් උල්ලංඝනය වූ විටක ඒ සම්බන්ධයෙන් නෛතික පිළිසරණ පැතීමේ ක්‍රමයක් නොතිබීම.

- ව්‍යවස්ථාවේ දක්වා තිබූ බොහෝ අයිතිවාසිකම් මෙරට පුරවැසියන්ට පමණක් සීමා කර තිබීම.

- ව්‍යවස්ථාවේ පිළිගන්නා ලද අයිතිවාසිකම් ක්ෂේත්‍රය පටු එකක් විය.

- මෙහි සඳහන් වන අයිතිවාසිකම් පැරණි ස්වාභාවික අයිතිවාසිකම් සම්ප්‍රදායයේ එන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්වලට සීමා විය.

ClassWork.LK

# අභ්‍යාස

පිටු පෙරළනයක් සැකසීම/පවර් පොයින්ට් (ඉදිරිපත් කිරීමක්) 1947 - 1972 ව්‍යවස්ථා යටතේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය සහ ප්‍රවණතා යන තේමාව පහත සඳහන් කරුණු ඇසුරින් ගොඩ නගන්න.

- ආණ්ඩුක්‍රමයේ නව/ ව්‍යවස්ථාවේ සංයුතිය.
- විධායකයේ ස්වභාවය හා බලතල.
- සුළු ජන අයිතිවාසිකම්.
- අධිකරණය හා රාජ්‍ය සේවය.
- මූලික අයිතිවාසිකම්.

නියමිත දිනයේ දී ඉදිරිපත් කිරීම සිදු කරන්න.

ClassWork.LK

ClassWork.LK